# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2350/37 – 2023 සැප්තැම්බර් මස 19 වැනි අඟහරුවාදා – 2023.09.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 2287/12 හා 2022.07.05 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දවූ ද, 2022 අංක 113 හා 2022.06.30 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දක්වෙන ඉඩම් කොටස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. එනමුත් මේ කියන ලද ඉඩම් කොටස් අතරින් මෙහි පහත විස්තර වන එම ඉඩම් කොටසේ භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් තවම භාරගෙන නැත. එබැවින් සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 2287/12 හා 2022.07.05 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත සඳහන් 2022 අංක 113 හා 2022.06.30 දින දරන ආඥාව මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/14/2020/CEB/148.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය:
DST/LND/07/F1/ACQUI/2020-i.
2023 ජුනි මස 21 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම්පත්තුව සුළු කොට්ඨාසයේ, රත්නෙළුම්වලයාය (ක.සි. 830075) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක HA/TSS/2020/534 හා 2021.02.05 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අංක 01 – දියස්යාය – ප්‍රමාණය: හෙක්. 1.0777**

උතුරට: ක.සි. 830075 කලාප 02හි කැබලි අංක 19 සහ 27; නැගෙනහිරට: ක.සි. 830075 කලාප 02හි කැබලි අංක 27, 3 සහ 32; දකුණට: ක.සි. 830075 කලාප 02හි කැබලි අංක 27, 3, 32 සහ 29; බටහිරට: ක.සි. 830075 කලාප 02හි කැබලි අංක 32, 29 සහ 19.

EOG 09 – 0161



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*